සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 62 S I,II |
|---|---|---|
| නම: ............................................ | පුරවැසි අධ්‍යාපනය | කාලය පැය තුනයි |

සැලකිය යුතුයි-
(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුර සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2,(3),(4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

01. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පාලන කටයුතු පවත්වාගෙන යාමේ ජනතාව සතු බලය හඳුන්වන්නේ,
1. විධායක බලය යනුවෙනි. 2. අධිපති බලය යනුවෙනි.
3. ඡන්ද බලය යනුවෙනි. 4. පරමාධිපත්‍ය බලය යනුවෙනි.

02. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම යනු,
1. බලය බෙදා හැරීම යි. 2. බලය විමධ්‍යගත කිරීම යි.
3. බලය පැවරීමයි. 4. බලය විතැන් කිරීමයි.

03. ශ්‍රී ලාංකික පුරවැසියෙකුට ඡන්ද අයිතිය හිමි වන වයස් සීමාව වන්නේ,
1. අවුරුදු 18 සම්පූර්ණ වීම. 2. අවුරුදු 12 සම්පූර්ණ වීම.
3.අවුරුදු 21 සම්පූර්ණ වීම. 4. අවුරුදු 16 සම්පූර්ණ වීම.

04. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් සභා ගණන වන්නේ,
1. 05 2. 07 3. 09 4. 08

05. පළාත් සභා පිහිට වූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කළ කුමන සංශෝදනය මගින් ද?
1. 22 සංශෝධනය. 2. 17 සංශෝධනය. 3. 18 සංශෝධනය. 4. 13 සංශෝධනය.

06. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටකට ඇති නිදසුනක් වන්නේ,
1. ඉන්දියාව. 2. කියුබාව. 3. ශ්‍රී ලංකාව. 4. ස්විස්ටර්ලන්තය.

07. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
1. එංගලන්තය හා ජපානය. 2. ඕලන්දය හා ඉතාලිය.
3. එංගලන්තය හා ප්‍රංශය. 4. පෘතුගාලය හා ස්පාඤ්ඤාය.

08. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,
1. ආණ්ඩුව යි. 2. අගමැතිවරයා යි. 3. ඇමතිවරු ය. 04. ජනාධිපතිවරයා ය.

09. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු සතු විය යුතු ගුණාංගයක් වන්නේ,
1. ප්‍රධාන ජාතියේ සංස්කෘතියට ගරු කිරීම. 2. අන්‍ය ආගම් වැලඳ ගැනීම.
3. අන්‍ය සංස්කෘතියට ගරු කිරීම. 4. අන්තර් විවාහ සිදු කිරීම.

10. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණය වන්නේ,
1. අධිකරණය. 2. ආණ්ඩුව. 3. පාර්ලිමේන්තුව. 04. විධායකය යි.

11. නගර සභාවක ප්‍රධානයා හඳුන්වනු ලබන්නේ,
1. සභාපති ලෙස ය. 2. නගරාධිපති ලෙස ය. 3. මන්ත්‍රී ලෙස ය. 04. කොමසාරිස් ලෙස ය.

12. රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ,
1. රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාව. 2. බලය විමධ්‍යගත වීම.
3. පාලකයින් දූෂණයෙන් තොර වීම. 4. නිලධාරීවාදය.

13. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමේ දී ප්‍රධාන නිර්ණායක ලෙස යොදා ගන්නේ,
1. ආගම හා ජන වර්ගය.
2. ජන වර්ගය හා භූමිය.
3. භූමිය හා ජනගහනය.
4. ආගම හා භූමිය.

14. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජන මාධ්‍ය සතු වගකීමක් වන්නේ,
1. ජනතාවගේ දැනුම වර්ධනය කිරීම.
2. විරුද්ධ පක්ෂයේ අදහස් ප්‍රචාරය නොකිරීම.
3. මූල්‍ය ලාභය මත කටයුතු කිරීම.
4. ආණ්ඩුවට පක්ෂපාතීව කටයුතු කිරීම.

15. ස්විස්ටර්ලන්තයේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන්නේ කුමක නමකින් ද?
1. පළාත් සභාව.
2. සන්ධීය මහා මණ්ඩලය.
3. නගර සභාව.
4. කොංග්‍රස් සභාව.

16. ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වන්නේ,
1. ආහාර.
2. ඇඳුම්.
3. ඖෂධ.
4. හිරු එළිය.

17. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන ඇමැතිවරයා පත් කරනු ලබන්නේ,
1. ආණ්ඩුකාරවරයා විසිනි.
2. ජනාධිපතිවරයා විසිනි.
3. අගමැතිවරයා විසිනි.
4. කථානායකවරයා විසිනි.

18. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුවක් වන්නේ,
1. විවිධ පක්ෂ පැවතීම.
2. රාජ්‍යයේ භූමි ප්‍රමාණය විශාල වීම.
3. නියමිත කාල සීමාවේ මැතිවරණය පැවැත්වීම.
4. පුරවැසි ආදායම් විෂමතා පැවතීම.

19. පළාත් සභාව තුළ මධ්‍යම රජය හා පළාත් සභාව සම්බන්ධීකරණය කරන නියෝජිතයා වන්නේ,
1. ප්‍රධාන ලේකම්වරයා.
2. මහ ඇමතිවරයා.
3. පළාත් සභාපතිවරයා.
4. ආණ්ඩුකාරවරයා.

20. ඇමරිකාවේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් වන්නේ,
1. මූල්‍ය කටයුතු.
2. අධ්‍යාපනය.
3. පළාත් පාලනය.
4. සෞඛ්‍ය.

21. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය මූලික දේවල් හැඳින්වෙන නම කුමක් ද?
1. උවමනා.
2. අවශ්‍යතා.
3. නිෂ්පාදන.
4. සේවාවන්.

22. රටක ජනතාව විසින් පිළිගෙන සම්මත ක්‍රියා කිරීමේ විධි හඳුන්වනු ලබන්නේ,
1. සංස්කෘතිය ලෙස ය.
2. සිරිත් ලෙස ය.
3. විරිත් ලෙස ය.
4. ආචාර ධර්ම ලෙස ය.

23. බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,
1. විවිධත්වය තුළ එක්සත්කම ගොඩනගා ගැනීමයි.
2. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
3. බලතල ඕනම අවස්ථාවක පවරා ගත හැකි වීම.
4. සියලුම තීරණ මධ්‍යම ආණ්ඩුව විසින් ගනු ලැබීම.

24. රාජ්‍යවල ප්‍රධාන ස්වරූප දෙක කුමක ද?
1. ජනාධිපති හා පාර්ලිමේන්තුව.
2. ඒකීය හා ප්‍රජාතන්ත්‍රවාදී.
3. ජාතික හා ප්‍රාදේශීය.
4. ඒකීය හා සන්ධීය.

25. මහජන නියෝජිතයන් මගින් රටක පාලන කටයුතු මෙහෙයවීම,
1. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි.
2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යි.
3. මහජන ප්‍රජාතන්ත්‍රවාදය යි.
4. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය යි.

26. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන් මගින් ඉටු කළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
1. වැඩිහිටියන්ට ගරු කිරීම.
2. මහජන දේපළ ආරක්ෂා කිරීම.
3. දෙමාපියන්ට සැළකීම.
4. සම්ප්‍රදායන්ට ගරු කිරීම.

27. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ක්‍රියාත්මක වන නූතන රාජ්‍යයන් උත්සහා ගන්නේ,
1. බහු වාර්ගිකත්වය තුළ ජාතිය ගොඩ නැගීම.
2. ගෝලීය අරමුණු තහවුරු කිරීම.
3. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම තහවුරු කිරීම.
4. සන්නිවේදනය සේවා සම්බන්ධීකරණය.

28. ග්‍රීක නාගරික රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය හැඳින් වූ නම වන්නේ,
1. පුරවැසි සභාව. 2. නගර සභාව. 3. පළාත් සභාව. 4. ප්‍රාදේශීය සභාව.

29. සන්ධීව ආණ්ඩුක්‍රමයක් පවතින රටක් වන්නේ,
1. ශ්‍රී ලංකාව. 2. රුසියාව. 3. එංගලන්තය. 4. ඇමරිකාව.

30. බහු සංස්කෘතික සමාජයක දක්නට නොලැබෙන ලක්ෂණයකක් වන්නේ,
1. විවිධ සිරිත් විරිත්. 2. එකම සම්ප්‍රදායන්ට අනුව ජීවත්වන මිනිසුන්.
3. විවිධ ඇඳුම්හිලි. 4. විවිධ භාෂා හා ආගම්.

31. රටක මූලික නීතිය වන්නේ,
1. විවිධ අණ පනත්. 2. නීතිය පිළිබඳ දැනුවත් අයගේ මත.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. 4. ජනාධිපතිගේ තීරණ.

32. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් සමාජය වෙත කළ යුතු යුතුකම් වර්ග දෙක වන්නේ,
1. නීතිමය හා සදාචාරාත්මක යුතුකම්. 2. නීතිමය හා ආගමික යුතුකම්.
3. නීතිමය හා ආර්ථික යුතුකම්. 4. නීතිමය හා සංස්කෘතික යුතුකම්.

33. සන්ධීය රාජ්‍යයක බලය බෙදා හැරීම සිදු වන්නේ,
1. ජනාධිපති හා ප්‍රාන්ත අතර. 2. ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතර.
3. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර. 4. මධ්‍යම ආණ්ඩුව හා ආණ්ඩුකාරවරයා අතර.

34. කිසිදු වෙනස්කමකට භාජනය නොකොට අයිතිවාසිකම් හා නිදහස භුක්ති විඳීමට ඉඩ සැලසීම හඳුන්වන්නේ,
1. සමානාත්මතාව නමිනි. 2. නීතිය නමිනි. 3. සදාචාරය නමිනි. 4. යුක්තිය නමිනි.

35. ශ්‍රී ලංකාවේ මුදල් පාලනය සිදු කරනු ලබන්නේ,
1. මුදල් ඇමැතිවරයා. 2. මහ බැංකුව විසින්. 3. අගමැතිවරයා විසින්. 4. ව්‍යවස්ථාදායකය විසින්.

36. මඩු දේවස්ථානය,
1. කතෝලිකයන්ගේ පූජනීය ස්ථානයකි. 2. හින්දු පූජනීය ස්ථානයකි.
3. බෞද්ධ පූජනෘය ස්ථානයකි. 4. ඉස්ලාම් පූජනීය ස්ථානයකි.

37. හින්දු ආගමකට අයත් ආගමික ග්‍රන්ථයක් වන්නේ,
1. බයිබලය. 2. අල්කුරානය. 3. භගවත් ගීතාව. 4. ධම්ම පදය.

38. ශ්‍රී ලංකාව තුළ ප්‍රාදේශීය මණ්ඩල හා ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීමට පටන් ගැණුනේ,
1. 1987 2. 1981 3. 1956 4. 1975

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව ලැයිස්තු තුනක් පදනම් කරගෙන බලතල වර්ගීකරණය කර ඇත.

A - සමාජ සෙවා සහ පුනරුත්තාපන කටයුතු. B - විදේශ කටයුතු.
C - සුළු වාරිමාර්ග වැඩ කටයුතු. D - ආගමන හා විගමන.
E - පළාත් නිවාස සහ සංවර්ධන වැඩසටහන්. F - ජනලේඛන හා සංඛ්‍යාලේඛන.

39. පළාත් සභා ලැයිස්තුවේ ඇති බලතල ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ABC 2. ACE 3. ADF 4. BCE

40. සංවෘත ලැයිස්තුවේ ඇති බලතල ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ABC 2. ACE 3. BDF 4. BCE

## ii කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් සහිත ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

01. i. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමේ වැදගත්කම් දෙකක් ලියන්න.
    ii. සප්ත අපරිහානි ධර්ම අතුරෙන් දෙක්ක සඳහන් කරන්න.
    iii. ප්‍රජාතන්ත්‍රවාදය වැදගත්වන ආකාර දෙක ලියන්න.
    iv. ඡන්දදායකයෙකු සතු අයිතීන් දෙකක් නම් කරන්න.
    v. ඕනෑම සමාජයක් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් ලියන්න.
    vi. ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න.
    vii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඇති රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
    viii.රාජ්‍යයට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.
    ix. ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන කටයුතු වලට සහභාගී වීමට අවසර නොලැබූ පුද්ගලයන් දෙකොටසක් නම් කරන්න.
    x. නීතියේ ආධිපත්‍යය සහිත සමාජයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

02. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ජනතාවට වඩාත් හිතකර පාලන ක්‍රමයකි.
    i. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල.02)
    ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් නම් කරන්න. (ල.03)
    iii. (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයන් තුනක් ලියන්න. (ල.03)
    (b) ඉන් එක කාර්යයක් පිළිබඳව විස්තර කරන්න. (ල.02)

03 බලය බෙදා හැරීම බොහෝ ජනවාර්ගික ප්‍රශ්න සඳහා යහපත් විසඳුමකි.
    i. ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම සඳහා ගෙන ඇති උත්සහායන් දෙකක් ලියන්න. (ල.02)
    ii. පළාත් සභාවක මහ අමැති සහ අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යය තුනක් ලියන්න. (ල.03)
    iii. (a) පළාත් සභා සඳහා බලය බෙදීමේ දී එය ලැයිස්තු තුනක් පදනම් කරගෙන සිදු කර ඇත. ඉන් සමගාමී ලැයිස්තුවේ සඳහන් බලතල තුනක් සඳහන් කරන්න. (ල.03)
    (b) ඉන් එක් කරුණක් පිළිඉඳව විස්තර කරන්න. (ල.02)

04. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයකි.
    i. සංස්කෘතිය පිළිබඳව නිර්වචන ඉදිරිපත් කර ඇති චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල.02)
    ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් ලියන්න. (ල.03)
    iii. (a) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන වාසි තුනක් ලියන්න. (ල.03)
    (b) ඉන් එක් වාසියක් පිළිබඳව විස්තර කරන්න. (ල.02)

05. ලෝකයේ විවිධ රටවල් විවිධ ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දෙනු ලබයි.
    i. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක ලියන්න. (ල.02)
    ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ප්‍රධාන අංශ තුන නම් කරන්න. (ල.03)
    iii. (a) නිෂ්පාදනය සාධක තුනක් නම් කරන්න. (ල.03)
    (b) ඉහත සඳහන් කළ නිෂ්පාදන සාධක දෙකක් සඳහා කරන ගෙවීම් නම් කරන්න. (ල.02)

06. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය බලය යනුවෙන් අදහස් කරන්නේ එම රාජ්‍යයේ පාලන කටයුතු පවත්වාගෙන යාමට එයට ඇති හැකියාව යි.
    i. බලයේ විවිධ ස්වරූප දෙකක් ලියන්න. (ල.02)
    ii. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ල.03)
    iii. (a) සන්ධීය රාජ්‍යන්හි නව ප්‍රවණතා තුනක් ලියන්න. (ල.03)
    (b) ඉන් එක් ප්‍රවණතාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

07. අතීතයේ සිට ලෝකයේ විවිධ රාජ්‍යය පාලනය කිරීම සඳහා විවිධ පාලන ක්‍රම භාවිතා කර ඇත.
    i. නියෝජිතයන් තෝරා ගැනීම සඳහා වර්තමානයේ බහුල වශයෙන් භාවිතා කරන නියෝජන ක්‍රම දෙක ලියන්න. (ල.02)
    ii. නිදහස් මා සාධරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න. (ල.03)
    iii. (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 03 ක් ලියන්න. (ල.03)
    (b) ඉන් එක් සාධකයක් පිළිබඳ විස්තර කරන්න. (ල.02)